# ලක්දිව මුතු කර්මාන්තයට දායකත්වය සැපයූ ඉස්ලාමීය, ද්‍රවිඩ සහ වෙනත් ජනවර්ග පිලිබඳ මානව වංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

**තිලංක මනෝජ් සිරිවර්ධන**


## Abstract

*Pearls or well known 'mutu' (Sinhala), are conjuring a vision of softness and iridescent beauty. It represents the delicate of feminine grace on precious and lustrous adornments. Majority of pearls are acquiring from sea pearls where billions and billions of pearl bearing animals and humans gave their lives. Though it is pains take measure, specific cultures has emerged with pearl industry in the countries which the pearl fishery has conduct in mass scale. Industry is totally a gambling, fortune passing from one hand to another. However, there are certain groups practicing the technology and knowledge of the industry, such as fishing, boating, valuing, ornament making, selling, as well as administration, camping, sanitation, etc. In Sri Lankan context, it is widely linking with the multi ethnic background as all major and minor groups had engaged in various specializing areas. The present paper is discussing about such groups as Islamic, Dravidians, etc. In here Islamic are introduced as a religious group which ân umbrella for many ethnic groups as Arabs, Moors, Mohammadans, Marakkalas, etc. They are most famous for their skill of trading, but also once they were keen divers skilled for skin diving. Also there are several groups of Dravidians, as Malayalam, Kerala's, Chetties, Paravas, etc., groups of castes, ethnic, and economic. Various historical sources reveal about these groups and it is expecting to study them in ethnological perspective. The study will lead to further examine on the existence of of such groups in present.*


**Key words:** Pearl, Islamic, Tamil, Paravar, Ethnology

**Author Details:** කථිකාචාර්ය, පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

**Citation:**සිරිවර්ධන, තිලංක මනෝජ් , (2013) ලක්දිව මුතු කර්මාන්තයට දායකත්වය සැපයූ ඉස්ලාමීය, ද්‍රවිඩ සහ වෙනත් ජනවර්ග පිලිබඳ මානව වංශ විද්‍යාත්මක අධ්‍යයනයක්), The Journal of Archaeology and Heritage Studies, 1(2)

## හැඳින්වීම

මුතු කර්මාන්තය ශ්‍රී ලංකාවේ පැරණි කර්මාන්ත අතර වඩාත් ජාත්‍යන්තර අවධානයට පාත්‍ර වූවක් මෙන් ම ශාස්ත්‍රීය අධ්‍යයනය තුල දී තරමක් අවම සලකා බැලීමකට ලක් වූවක් ද වේ. වෙසෙසින් මුතු කර්මාන්තය හා බැඳුණු මානව වංශ විද්‍යාත්මක අධ්‍යයනය සීමා සහිත පරාසයක සිදු වී ඇත. යටත් විජිත යුගයට අයත් ලේඛනවල මෙම මාතෘකාව යම් තරමක් සාකච්ඡාවට ලක්කර ඇති අතර ඒ පරිපාලනමය සහ වාර්තාමය අවශ්‍යතා මත

ශ්‍රී ලංකාවේ මානව වංශ විද්‍යාත්මක අධ්‍යයනවල දී කුලය සහ සමාජ ස්ථරායනය ද වෘත්තිය ද සැලකිල්ලට පාත්‍ර වී ඇත. මෙවැනි සංස්කෘතිකමය සමාජ සම්බන්ධතාවයක් ලෙස වෘත්තිය වෙසෙසින් පැවතෙන අතර එය යම් අවස්ථාවල කුලය පිලිබඳ යම් තීරණාත්මක සාධකයක් ලෙස ද උපයෝගී වී ඇත. භාරතය මේ සම්බන්ධයෙන් වඩාත් පැහැදිලි උදාහරණ සපයයි. ශ්‍රී ලංකාවට ද මේ සම්බන්ධ අත්දැකීම භාරතීය අභාසය යටතේ ලැබුණේ වුව ද එහි තීව්‍ර බව

එතරම් දැඩි නොවූ සෙයක් පෙන්වයි. කුලය වෙනුවෙන් අර්ථවන Caste මගින් වර්ණ හෝ ජාති යන්න අර්ථවන අතර (Beteille, 2010, 112) එය භාරතීය ව්‍යවහාරය අනුව දේව නිර්මිත සදාකාලික සංකල්පයකි. නමුත් ශ්‍රී ලංකාවේ දී එය වෘත්තිය පදනම් කරගත් 'කුල' සංකල්පයෙන් දැකිය හැකිය. ඊ.ආර්. ලීච්ට අනුව සිංහලයා විසින් වරිග (tribe) යන්න සියලුම සමාජ කණ්ඩායම් උදෙසා ව්‍යවහාර කරනු ලැබේ. එනයින් ගත් කල භාෂා කණ්ඩායමක් වන දමිලයන්, ආගමික කණ්ඩායමක් වන ඉස්ලාමිකයන්, සංස්කෘතික සහ ගෝත්‍රික කණ්ඩායමක් වන වැද්දන්, සමාජ වෘත්තීය කණ්ඩායමක් වන රජකයන් 'වරිග' යන යෙදුමෙන් හැඳින්වේ (Leach, 2003, 45). ලීච් දක්වන ආකාරයට මෙහි අවසානයෙන් සඳහන් කළ පිරිස සැබෑ කුල යන වර්ගයට අයත් වන අතර එය භාරතීය ආකෘතියේ රාජ්‍යත්වය මෙරට ස්ථාපනයට සමගාමීව ම පැමිණියක් බව පැහැදිලි කරයි. අනෙක් 'වරිග' වර්ගීකරණයට අයත් කණ්ඩායම් 'ජන වරිග' (ethnic) ලෙස වර්ග කල හැකි ය. මෙම දෙකොටසේ ම ඓතිහාසික පැවැත්ම පූර්ව ඓතිහාසික යුගය දක්වා ගෙන යා හැක්කේ පණ්ඩුකාභයගේ අනුරාධපුර නාගරික සැලසුම්කරණය සම්බන්ධ තොරතුරු සමගිනි. මෙම අවධියේ සිට ම භාරතීය ආකෘතිය ශ්‍රී ලංකාව කෙරෙහි බලපවත්වන්නේ වුව ද වඩාත් ලාක්ෂණික කරුණ නම් අන්තගාමී දැඩි සමාජ ස්ථරායනයකට වඩා මෙරට වඩාත් මෘදු ලෙස කටයුතු කළ බවයි.

ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධියේ සිට ලැබෙන සාධක අනුව සම්පත් භාවිතය සහ සමාජ ස්ථරායනය අතර සම්බන්ධතාවයක් පවතී. නිදසුනක් වශයෙන් මැටි නිධි ආශ්‍රිතව වාසය කරන සහ එය ආර්ථිකමය වශයෙන් භාවිතයේ යොදවන පිරිස ක්‍රමයෙන් අදාල කර්මාන්තයන්හි ප්‍රවීණයන් බවට පත් වීමත් ඒ අනුව ඔවුනට ලැබුණු සමාජ හඳුනාගැනීම ක්‍රමයෙන් කුම්භකාර කුලයක් දක්වා වර්ධනය වීමත් දැක්විය හැකිය. වාර්ගික වශයෙන් ගත් විට මහා සංස්කෘතියක පරිධියේ එයට දුරස්ථ සම්බන්ධයක් දක්වමින් වාසය කරන වැදි ජනතාව වැනි කොටස් තම පරිසරය ගැටෙමින් ස්වකීය සංස්කෘතිය සකසා ගෙන ඇත. මෙම ලිපිය තුලින් අවධානය යොමු කරනුයේ කුල සහ වාර්ගික පදනමින් යුතුව මුහුදු බෙල්ලන් භාවිතයෙන් සමාජයේ වෙන ම හඳුනාගැනීමට ලක්වූ කණ්ඩායම් සහ එම සම්පත සමග සබඳතා දැක්වූ පොදු කණ්ඩායම්වල මැදිහත් වීම සම්බන්ධයෙනි. එහි දී මුතු බෙල්ලන් (*Pinctada vulgaris*) ඇල්ලීම සඳහා සංවිධානය වූ කඳවුරු හා බැඳුනු ජන වර්ග පිළිබඳ ව අවධානය යොමු කරන අතර ප්‍රධාන අවධානය ඉස්ලාමිකයන්, ද්‍රවිඩයන් අතර බෙදී යයි.

## මුතු කර්මාන්තය ආශ්‍රිත මූලික ජන සංයුතිය

මුතු කිමිදීම කර්මාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ස්ථාපිත වීම වෙරළබඩ කලාපයේ ජන සංයුතිය සකස් වීම කෙරෙහි සෘජු බලපෑමක් කිරීමට සමත් විය. කර්මාන්තයේ ප්‍රධාන ශ්‍රම ඒකකය වන කිමිදුම්කරුවන් බොහෝ විට විවිධ රටවල වහලුන් වශයෙන් ක්‍රියාත්මක වනු හඳුනාගත හැකි ය. නිදසුනක් වශයෙන් ස්පාඤ්ඤයන් විසින් කැරිබියානු කලාපයේ දී මධ්‍යම ඇමරිකානු ස්වදේශිකයන් සහ අප්‍රිකානුවන් වහලුන් ලෙස යොදවාගෙන මුතු කර්මාන්තය සිදු කිරීම වැනි අවස්ථා වාර්තා වන අතර (Romero et al,1999,65) ආසියාතිකව එවැනි කිමිදුම්කරුවන් නිදහස් වෘත්තිකයන් ලෙස විශේෂ ශිල්පී ප්‍රාගුණ්‍යයක් සහිතව වෘත්තියේ නිරත වූහ. ශ්‍රී ලංකාවේ යුරෝපීය පාලනය සම්බන්ධ වාර්තා අනුව ඔවුන් වැටුප් ගෙවීම් හෝ ආදායම ලැබීම් පදනම මත සේවයේ යොදවාගත් පිරිසක් ලෙස හඳුනාගත හැකිය. මුතු කිමිදුම් කටයුතුවලදී ඒ හා බැඳුණු ජනවර්ගවල සංස්කෘතිය අදාල කර්මාන්තය වෙත සෘජු බලපෑමක් ඇති කරන ලදී. නිදසුනක් ලෙස කිමිදුම් සෘතුවේ දින සීමා වීමට රෝමානු කතෝලික කිමිදුම්කරුවන් ඉරිදා දින නිවාඩු ගැනීමත් හින්දූන් සහ මුහම්මදික කිමිදුම්කරුවන් තමන්ගේ ආගමික දිනවල නිවාඩු ගැනීමත් බලපාන ලදී (Percival, 1805, 88). දළ වශයෙන් පසුගිය සියවස් හතර පුරාවට පැවතුණු මුතු කිමිදුම් කඳවුරු සඳහා වාර්ෂිකව අදාල කිමිදුම් සෘතුවට 40000 - 50000 අතර ජනගහණයක් එක් වී ඇති අතර එය විවිධ ජන වර්ගවල එකතුවක් විය (Kunz & Stevenson, 1908, 103,105., Vamadevan,1995,75,).

කිමිදුම්කරුවන් සහ මුතු කිමිදුම් කඳවුරු ආශ්‍රිතව කටයුතු කළ පිරිස් පිළිබඳ කරුණු දක්වන යටත් විජිත ලේඛන ජන වාර්ගික වශයෙන් දමිළයන් සහ මුහම්මදික බහුතරයට

අමතරව හීන්දෑරි, යන්තමින් විලි වසාගෙන තමන්ට ම ආවේණික හිස් වැස්මක් පැළඳ සිටින ශිෂ්ට වූ සිංහලයන් ද, පර්සියාවේ සිට පැමිණි කාර්යශූර අරාබීන් ද, තරබාරු මුහම්දිකයන් ද, ශක්තිමත් උඩරටියන් ද, වැද්දන් ද, චීන, යුදෙව්, පෘතුගීසි, ඕලන්ද, වැනි වාර්ගික නාම යටතේ විස්තර කර ඇත (Kunz & Stevenson, 1908, 109). එසේ ම ඔවුන් පැමිණෙන ප්‍රදේශ අනුව විශේෂිතව වර්ගීකරණය විය. නිදසුනක් ලෙස 1905 වසරේ මුතු කිමිදුමට සහභාගී වූ කිමිදුම්කරුවන්ගෙන් 4991 න් 2649 ක් මධුරා වෙරළේ කිලාකරෙයි හා තොන්ඩි ආදී ප්‍රදේශවලින් පැමිණ සිටි මුවර්වරුන් ද කිලාකරයි, යාපනය, ටියුටකොරින්, මන්නාරම, පාම්බන්, නාගපටම් සහ කොළඹ සිට පැමිණි 923 අරාබි ජාතිකයන් ලෙස ද එම ප්‍රදේශවලින් ම සහ දේවිපටම්, අද්‍රාපටම්, අම්මාපටම්, කොඩ්ඩයිපටම් සහ කායෙල්පටම් සිට පැමිණි දමිළ කිමිදුම්කරුවන් 3644 ද ලංකාවේ එරුක්කලම්පිඩ්ඩි ප්‍රදේශයන් පැමිණි මුස්ලිම්වරු 424 ක් ලෙස ද සෙසු 995 වූ පිරිස ටියුටිකොරින්, රාමේස්වරම් හා මද්‍රාසි වෙරළේ ප්‍රදේශවලින් පැමිණ දමිලයන්ගෙන් ද මලබාර් වෙරළෙන් පැමිණි මලයාලම්වරුන්ගෙන් ද, සමන්විත වූ බව සඳහන් වන අතර ඉතා සුලු ප්‍රමාණයක් වෙනත් ආසියාතික වෙරළවලින් පැමිණි මිනිසුන් විය ( Kunz & Stevenson,1908,113., Sessional Papers, 1905, XXXIII,06). 1925 පැවැත්වුණු මුතු කිමිදීම් සෘතුවට කිමිදුම්කරුවන් 1908 පැමිණි අතර එයින් 157 (8.5%) හැර සෙස්සන් අරාබියෙන් සහ දකුණු ඉන්දියාවෙන් පැමිණි කිමිදුම්කරුවන් වූ බව සඳහන් වේ (Sivalingam,1961, 9).

යටත්විජිත යුගයේ දී කිමිදුමකරුවන් වශයෙන් සිංහලයන් සේවය කළ බවට පැහැදිලි සාධක නොමැත. 1748-9 වසර වල දී කන්ද උඩරට රජු විසින් හලාවත සහ කම්මල මුහුදු තීරයේ මුතු කිමිදීමට එවූ පිරිස (Gollenness, 1973, 79) සිංහලයන් වූ බව උපකල්පනය කළ හැකි ය. නමුත්, පාලන වාර්තාවල පැහැදිලිව මුහම්මදිකන් සහ හින්දූන් ලෙස වර්ග කිරීමක් දක්වන මුත් සිංහලයන් පිලිබඳව දක්වන නිහඬතාවයෙන් පෙනී යනුයේ ඔවුන් ප්‍රකට ලෙස කිමිදුම්වල නිරත නොවූ බවකි. කෝඩිනර් ද සඳහන් කරනුයේ කිසිදු සිංහලයෙක් කිමිදුම්කරුවෙකු ලෙස කටයුතු නොකරන බවය. එමෙන් ම මුතු සෘතුවේ වෙනත් කටයුත්තකදී වුව ද ඔවුන් සහභාගී වනුයේ ඉතාමත් අවම වශයෙන් බවත් එබැවින් එය ඔවුනගේ බයාදු චරිත ලක්ෂණයක් ලෙසින් සැලකෙන බවත් දක්වන කෝඩිනර් එසේ වුව ද, සිංහලයන් විශාල ප්‍රමාණයක් මීගමුවේ සිට අරිප්පුව දක්වා සාමාන්‍ය ධීවර යාත්‍රා පන්නයේ නිරත වෙමින් වෙළඳපොලට මාළු සපයා සැලකිය යුතු ලාබයක් ලබාගැනීමට සමත් වූ බවත් දක්වයි (Cordiner, 1807, 40).

යුරෝපීයයන් ද වෘත්තීය මට්ටමෙන් මුතු කිමිදුම්කරුවන් ලෙස සහභාගී වූ බවට වාර්තා ඇත්තේ එක් අවස්ථාවක් පමණි. එය ද පර්යේෂණාත්මක යෙදවීමක් විය. මුතුපර පාලකයකු වූ ඩොනන් විසින් කිමිදුම් උපකරණ සහිතව යුරෝපීය කිමිදුම්කරුවන් කිහිපදෙනෙකු හලාවත මුතු කිමිදීමේ යෙදවූව ද කිසිදු උපකරණයක සහයෙන් තොරව කිමිදීමේ යෙදුණු සාම්ප්‍රදායික කිමිදුම්කරුවන් සමඟ තරඟවැදීමට හෝ ඔවුන් ඉක්මවායාමට යුරෝපීය කිමිදුම්කරුවන් අසමත් වූ බව ඔහු දක්වයි (Donnan,1900,181).

සැබැවින් ම පසුගිය සියවස් කිහිපය පුරාවට ම ඇති වාර්තා අනුව මූලිකව පෙනී යන කරුණක් වනුයේ මුතු කර්මාන්තය සඳහා ප්‍රධානතම දායකත්වය ලබා දී ඇත්තේ ද්‍රවිඩ ජන වර්ගයට සහ ඉස්ලාම් භක්තියට අයත් පිරිස් බවය (Ferguson, 1891, xvi., Forbes, 1972, 256). ඉස්ලාම්කයන්ගේ සමාජ ලක්ෂණය වාර්ගික වශයෙන් ද දමිලයන්ගේ සමාජ ලක්ෂණය කුල වශයෙන් ද නිර්මාණය වී තිබූ බවට සාධක පවතී.

### ඉස්ලාම් භක්තිකයෝ

ලංකාවේ සිටි සහ විදේශයන්ගෙන් පැමිණි ඉස්ලාම් භක්තිකයන් මුතු කිමිදීම් සෘතුවල දී ඉහළ මැදිහත්වීමක් දැක්වූහ. ඔවුන් පිලිබඳව තොරතුරු දැක්වීමේ දී විවිධ නාම භාවිතය ට ගෙන ඇති අතර (නිදසුන් ලෙස, මුවර්, මුස්ලිම්, මුහමදන්, මරක්කල, අරාබි, හම්බ, යෝනක ආදි යෙදුම් එක්ව යෙදේ) ඒ ඔවුන් පැමිණි ප්‍රදේශ, සමාජ තත්ත්වය සහ පොදු ව්‍යවහාර නාම ඇසුරින් ය. නමුත් පොදුවේ ඔවුන් සියලු දෙනා ඉස්ලාම් භක්තිකයන් වූ බව සැලකිය හැකි බැවින් මෙහිලා ඔවුන් සියලු දෙනා එම පොදු නාමයට අයත් කරනු ලැබේ. අරාබිවරුන් හෙවත් සෘජුව ම මැද පෙරදිග කලාපයේ සිට පැමිණි ඉස්ලාම්

භක්තික ප්‍රජාවෝ මුතු කර්මාන්තය වෙත ක්‍රි.ව. 6 සියවසේ සිට පමණ ම අවධානය යොමුකළ බවට සාධක පවතී. සස්නි මුහම්මද් (ක්‍රි.ව. 971 - 1030) ගේ රාජසභාවේ පඬිවරයකු වූ අල් බීරූනි (ක්‍රි. ව. 973-1048) විසින් සෙරන්ඩිබයේ හෙවත් ශ්‍රී ලංකාවේ සමකාලීන මුතු කර්මාන්තය පිලිබඳව අවධානය දක්වා වාර්තා කර ඇත (Sachau, 1910, 211). ක්‍රිස්තු වර්ෂ නමවන සියවසේ අබුසයිද්, ක්‍රිස්තු වර්ෂ 13 සියවසේ දී කස්වීනි, ක්‍රිස්තු වර්ෂයෙන් 14 සියවසේ දී ඉබන් බතුතා සහ වෙනත් බොහෝ වෙළඳ සබඳතා ඇති ඉස්ලාමික ගවේෂකයන් ද මෙරට මුතු පිළිබඳව සඳහන් තැබූහ (Tennent,1996,574,580).

ඉස්ලාමිකයන් මෙරට මුතු කිමිදුම් වෙත යම් මැදිහත්වීමක් කිරීමට උත්සාහ කල බවට සාධක ලැබෙනුයේ 15වන සියවසෙනි. හලාවත ප්‍රදේශයේ පවතින ජනප්‍රවාදයකයට අනුව හලාවත මහවැව ප්‍රදේශයේ විසූ තනිවැල්ලාභය නම් පාලකයාගේ මාලිගාවත්ත නම් ප්‍රදේශයේ වූ මාලිගයට අවශ්‍ය මුතු සපයන ලද මුතු පන්තිය ග්‍රාමයට මුස්ලිම් කොල්ලකරුවන් පිරිසක් කඩා වැදී මුතු කිමිදීම සහ එම කර්මාන්තය සියතට ගැනීමට දැරූ ප්‍රයත්නය රජු විසින් දකුණු ඉන්දියාවෙන් ගෙන්වා ගත් ආරක්ෂක හමුදාවක ආධාරයෙන් වලක්වාගෙන ඇත. මෙම ආධාරක සේනා දැක්වූ සහයෝගයට ප්‍රසාදය පල කිරීමක් වශයෙන් රජු විසින් උඩප්පුව ප්‍රදේශය ඔවුනගේ වාසය පිණිස ගෞරව සහිත ව පවරා දෙන ලද බව ජනප්‍රවාදයේ වැඩිදුරටත් සඳහන් වේ (පෞද්ගලික සන්නිවේදනය කුලතුංග සමහ, 2009). මෙම සිදුවීම රාජාවලිය සහ වන්නි රාජාවලිය ද සනාථ කරයි. එම මූලාශ්‍රය අනුව එය ධර්ම පරාක්‍රමබාහු රජුගේ කාලයට සමකාලීනව සිදු වී ඇත. රාජාවලියට අනුව යොන් පට්ටනමෙන් ආ අදිරා නම් මුස්ලිම් කොල්ලකරුවකු (රාජාවලිය, 1959,78) (වන්නි රාජාවලියට අනුව කායල පට්ටනමෙන් පැමිණි කදිරා නම් කොල්ලකරුවා, - වන්නි රාජාවලිය, 2005,113) මෙම කොල්ලකෑම සිදුකරන ලැබ ඇත. ඔහු තම සේනාව ද සමඟ පැමිණ එවකට කෝට්ටේ රජුගේ පාලනය යටතේ පැවති මෙරට මුතු කිමිදීමේ බලය පැහැර ගැනීමට දැරූ උත්සහාය ව්‍යවර්ථ කරන ලද්දේ රජුගේ සහෝදරයන් වූ සකලකලාවල්ලභ සහ තනියවල්ලභ කුමාරවරුන් විසින් බව උක්ත මූලාශ්‍රය දෙක ම දක්වයි. බලය යොදවා මුතු කර්මාන්තයට ඇතුලත් වීමට යම් උත්සහායක් ඉස්ලාමිකයන්ගේ පැවතුනේ වුව ද එය පෘතුගීසින්ගේ ආගමනය සමග අඩපණවන්නට ඇති බව නිගමනය කල හැක්කේ පසුව ඔවුන් පෘතුගීසින් යටතේ අදාල කර්මාන්තයේ නිරත වූ බැවිනි.

නමුත් එයින් පසුව පවා ශ්‍රමිකයන් වශයෙන් ඔවුන්ගේ මැදිහත් වීම ක්‍රමානුකූල වැඩිවීමක් පසුගිය සියවස් දෙක තුල පවතින වාර්තා නිරූපනය කරයි. ඉහත ද දැක්වූ ආකාරයට, සාමාන්‍ය මුතු කිමිදුම් සෘතුවක වැඩිම ජන සංයුතිය ද්‍රවිඩ සහ ඉස්ලාමිකයන්ගෙන් අපේක්ෂිත විය. වාර්තාගත ඉතිහාසයේ පැමිණි වඩාත් විශාල අරාබි කිමිදුම් කණ්ඩායම ලෙස 1906 වසරේදී මුතු කිමිදීමට පැමිණි කිමිදුම්කරුවන් සැලකිය හැකිය. එවර කිමිදුම්කරුවන් 8600 න් 4090 ම අරාබීන් විය. ඔවුනගෙන් බහුතරයක් කුවේට් හා බහරේන් පැමිණි අතර මුතු කිමිදුම්කරුවන් සඳහා නම් දැරූ ලංකාවේ එරුක්කලම්පිඩ්ඩි ප්‍රදේශයෙන් පැමිණි මුස්ලිම් කිමිදුම්කරුවන් හා දමිලයන් පරදවන සුලු තරම් කාර්යශූර හා දක්ෂ පිරිසක් ලෙස සඳහන් වේ. සෘතුව ආරම්භ වීමේදී ම පැමිණ කඳවුරෙන් අවසානයට පිටවී යන මෙම අරාබි කිමිදුම්කරුවන් ඉන්දියයන් පවා පසුබට වන රළු මුහුද පවතින දිනවල පවා කිමිදීමේ නිරත වූහ. එරුකලම්පිඩ්ඩි කිමිදුම්කරුවන් බොහෝ විට සෘතුව අවසාන වීමට පෙර ම කඳවුරුවලින් ඉවත්ව ගියහ (Hornell, 1922, 113). මේ අතර පර්සිවල් විසින් මුහම්මදික ගෝත්‍රයක් ලෙස මන්නාරම් දූපතේ වසන ලුබ්බෙවරුන් දක්වයි. මලබාර් වෙරළේ කොමරින් තුඩුව හා අන්ජන්ගා අතර කොලොන්ග් නම් ප්‍රදේශයෙන් පැමිණෙන අතිශය දක්ෂ කිමිදුම්කරුවන් වෙත තරඟයක් දිය හැකිව තිබුණේ මෙම ලුබ්බෙවරුන්ට පමණක් බවත් පර්සිවල් වැඩිදුරටත් සඳහන් කරයි (Percival, 1805, 89). 1676 වාර්තාවකට අනුව මුහම්මදිකයන් වෙනත් ජනවර්ග සමඟ එක් නොවී තමන්ගේ යාත්‍රාවල නැගී ස්ව ආගමිකයන් සමඟ පමණක් ම කිමිදුම් කටයුතු වල නිරත වූහ (Tavernier, 1889, 119). ඔවුන් වෙනුවෙන් වෙන ම නායකයන් සිටි බව ඕලන්ද මුතු කිමිදුමක මූල්‍ය වාර්තාවේ මුහම්මදික ප්‍රධානියා ලෙස කිමිදුමට සහභාගී වූ පරිබෝ [illegible]

නායිනා නැමැත්තකු පිළිබඳව වන සඳහනෙන් පැහැදිලි වේ (Hornell, 1922, 173).

පෘතුගීසි යුගයේ සිට මුහම්මදිකයන් කිමිදුම් කටයුතු වෙත එක් වීම පිළිබඳව තොරතුරු පැහැදිලිව හමුවන අතර ඔවුන් වෙත සෙසු වාර්ගිකයන්ට වඩා වෙනස් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක විය. නිදසුනක් ලෙස ආරක්ෂක බද්ද අයකිරීමේ දී මුහම්මදිකයන්ට ඉහළ බද්දකට හා කොන්දේසිවලට යටත් වීමට සිදුවූ අතර (Tavernier, 1889, 118) සමස්ත කිමිදුම් සෘතුවේ එක් දිනක අල්ලනු ලැබූ බෙල්ලන් ප්‍රමාණය ඕලන්ද රජයට ගෙවීමේ නියමයක් ද ඔවුන් වෙත විය (Tavernier, 1889, 119). පසුකාලීන 1925 අංක 02 දරන මුතු කිමිදීම් පනතේ ද කිමිදුම්කරුවන්ට බලපත්‍ර නිකුත් කිරීමේ දී එය වෙන වෙන ම අරාබි කිමිදුම්කරුවන් සහ අරාබි නොවන කිමිදුම්කරුවන් සඳහා ලෙස නිකුත් කිරීම සිදුවිය. අරාබි කිමිදුම්කරුවන්ට බලපත්‍ර නිකුත් කෙරුණේ මූල්‍ය තැන්පතුවක් (රූ.15) ගෙවීමෙන් අනතුරුවය.

**ද්‍රවිඩයෝ**

ද්‍රවිඩ යන වාර්ගිකත්වය මෙහිදී සමස්ත දක්ෂිණ භාරතීය සහ ශ්‍රී ලංකාවේ අදාල භාෂා පවුලට අයත් පිරිස් වෙනුවෙන් යොදාගනු ලැබේ. මුතු කිමිදුම් කටයුතු සම්බන්ධයෙන් දකුණු ඉන්දියානුවන් අතර අතීතයේ සිට ම යම් උනන්දුවක් පැවතිනු අතර තමන් සතු පර බොහෝ සාර්ථක ලෙසින් ඔවුන් භාවිත කල බැවින් එය වඩා විශේෂිත ජන සංකේන්ද්‍රණ ද ඇති විය. එපමණකින් නොනැවතුණු දකුණු ඉන්දිය පාලකයන් සහ යාපනය පාලකයන් ශ්‍රී ලංකාවේ මුතු පරවල පාලනය ද සියතට ගැනීමට උත්සහා ගැනීමෙන් අදාල ජන වර්ග මෙරට මුතු කර්මාන්තයට ක්‍රියාකාරීව එක් වූ බව සැලකිය හැකි ය. යාල්පාන වෛපමාලයට අනුව ජයවීර සිංගයි ආරියන් සහ පුවෙනියවාකු (භුවනෙකබාහු) අතර මන්නාරමේ මුතු කිමිදීමේ අයිතිය සම්බන්ධයෙන් ගැටුමක් ඇති විය (Rasanayagam, 1984, 346). පොලොන්නරුව යුගයේ සිට ම මුතුපරවල අයිතිය දකුණු ඉන්දියයන් නතුකරගැනීමට උත්සහා දැරූ බවක් ද මෙයින් පෙනී යයි. මාර්කෝ පෝලෝ දක්වනුයේ තමන් පැමිණි කාලයේ මාබාර් සිට සෙයිලාන් දක්වා වූ මුතු පරවල කිමිදීමේ අයිතිය අයත්ව තිබුණේ මාබාර් හි රජු වූ සෙන්දර් බාන්දිට බවය (The Travels of Marco Polo ,283). මාබාර් යනු මලබාරය වශයෙන් ද පාලකයා සුන්දර් පාණ්ඩ්‍ය ලෙස ද හඳුනාගත හැකිය. රෂිඋද්දීන් තමන්ගේ ජමි උද් තවාරික් කෘතියෙන් කුලාම් සිට සිලාවර් දක්වා පාරසංග 300 දිග පළල වන ප්‍රදේශයක් මාබාර් ලෙස හඳුන්වාදෙන අතර (යුලේ මෙය හඳුනාගන්නේ තන්ජෝර් සහ රාම්නාද් අතර ප්‍රදේශය වශයෙනි) තමන්ගේ වාර්තාවට අදාල කාලයේ අවසාන වසර කිහිපයේ එහි දේවර් ලෙස සුන්දර් බාන්දි පාලනය ගෙන ගිය බවත් ඔහුගේ සහෝදරයන් තිදෙනා සහ මුහම්මද්දික උපදේශකයා ද පාලනයට මැදිහත් වූ බවත් සඳහන් කරයි. අල් හිජ්රා 692 (ක්‍රි.ව. 1293) දී සිදුවූ සුන්දර් බාන්දිගේ මරණින් අනතුරුව බලය සහ රාජ්‍යයේ ධනය පිළිබඳ ගැටුම් ඇතිවූ බව රෂි උද්දීන් දක්වයි (Yule, 1869, 346, 349). මුතු පර පිහිටි ප්‍රදේශය ද එම බලය පිළිබඳව සාධකයක් බවට ද එයින් පත්වූ බව නිසැක ය. මෙමගින් ශ්‍රී ලංකාවේ මුතු කර්මාන්තය වෙත පැවති දක්ෂිණ භාරතීය බලපෑම වඩාත් පැහැදිලි වේ.

පැරණි දමිල කෘතියක් වන කල්වෙඩ්ඩු හි සඳහන් වන සිදුවීමක් ද මෙරට මුතු කිමිදීම වෙත පාණ්ඩ්‍ය මැදිහත් වීම පැහැදිලි කරන අතර ම තවත් සුවිශේෂී සඳහනක් කරයි. එනම්, මුතු ඇල්ලීමේ නිරතව සිටි පරව නම් ජන කොටසක් පිළිබඳව ය. ධීවර කටයුතුවල නිරත මිනිසුන්ගේ සමාජ තත්ත්වය පැහැදිලි කිරීමේ දී එම කෘතිය මෙම විස්තරය ඉදිරිපත් කරයි. එයට අනුව,

> *මධුරාවේ රජු වූ පාණ්ඩ්‍යගේ දියණිය වූ අල්ලියරසානි වෙත කප්පම් වශයෙන් මුතුවලින් ගෙවීම් කළ විදානාරායනෙන් වෙඩ්ඩි හා පරවු මිනිසුන් මුතු බෙල්ලන් අල්ලමින් සිටින අතරතුර මුහුදේ අයහපත් කාලගුණයකට ලක්ව ලංකාවේ වෙරළට ගසාගෙන යන ලද අතර ඔවුන් එහිදී කරයිනෙර්කායි හා කුතිරමලයි (කුදිරමලෙයි) සොයාගත්හ. විදානාරායනෙන් වෙඩ්ඩිගේ නැවේ ධනය තැන්පත් කල පරවයන් විසින් කඩලිහිලපම් හා කල්ලාවිහිලපම් වල මුතු කිමිදීම් කටයුතු ආරම්භකළ අතර යකඩ රන් බවට හැරවිය හැකි ගස් ද (එම ප්‍රදේශවලට) හඳුන්වාදුන්හ...... (Thurston,1909,147).*

පාණ්ඩ්‍යයන් පිළිබඳව සඳහන් වන මෙම කථා පුවතින් ද ඉහත ද සඳහන් කළ පාණ්ඩ්‍ය අභ්‍යන්තර ගැටුම් පැවති යුගය නිරූපනය වන බව නිසැකය. මෙහි එන අල්ලියරසානි යනු ලංකාවේ වයඹ දිග ප්‍රදේශයේ කුදිරමලයේ සිටි අයකු ලෙසත් භාගවතයේ ඇය චිත්‍රාන්ගදායි ලෙස හැඳින්වෙන බවත් කාසි චෙට්ටි විසින් හඳුනාගනු ලබයි. ඇය වෙත පරවයන් මුතු වලින් කලම් 10 වටිනා මුතු වාර්ෂිකව කප්පම් ලෙස ගෙවූහ (Casie Chitty,1837, 132). හර්ඩ්මාන් විසින් මෙහි සඳහන් වන කරයිතෙර්කායි යනු කරෙයිතිවු ලෙස ද කඩලිහිලපම් යනු සිලාවතුර ලෙස ද කල්ලාවිහිලපම් යනු හලාවත ලෙස ද හඳුනාගනියි (Herdman, 1903,02). මෙම කථාපුවතේ සඳහන් වන පරවයන් යනු කවුරුන්දැයි විමසා බැලීම වැදගත් වනුයේ ඔවුන් මුතු කර්මාන්තය හා සම්බන්ධව සිටි වඩාත් ශිල්පීය ප්‍රාගුණ්‍යයක් සහිත වූ පිරිස වශයෙන් සැලකෙන බැවිනි.

## පරවයෝ

මුතු කිමිදුම් කඳවුරක ද්‍රවිඩයන් නිතර ම වාර්ගිකව නියෝජනය වූ අතර ම එම වාර්ගිකත්වය තුල යලිත් කුල වශයෙන් සංවිධානය වීමක් ද දැකගත හැකි ය. පෘතුගීසි සහ ඕලන්ද යුගවල දී යාපනයේ මුතු කිමිදීම සම්බන්ධයෙන් සඳහන් කරන විට නිතර ම නාමිකව දක්වන කුලයක් විය. පොදුවේ පරුවාස් හෝ පරවා (Parruas or parawas) නමින් ද ශ්‍රීමත් ඩබ්. ටවයිනම් විසින් පුරවූ වශයෙන් ද හඳුන්වා ඇති අදාල කුලය, අදාල යුගවල බලයේ සිටි අපරදිග වෙළඳ සමාගම් මඟින් තම සේවය සඳහා යොදවාගත් හ (Herdman, 1903,02., Baldaeus,1960, 371,. Pieris,1992,99). මදුරෙයිකංචි නම් දමිල සාහිත්‍ය කෘතියට දක්වනුයේ පරවයන් වනාහි මුතු බෙල්ලන් සහ හක් බෙල්ලන් ඇල්ලීමේ නිරතවූ කොර්කායි නගරය පදනම් කරගෙන වාසය කල පිරිසක් බවයි (Hornell, 1914, 43). යුරෝපීය බලපෑම යටතේ නාමික ක්‍රිස්තියානින් වූ මොවුන් එම යුගයේ ප්‍රධාන වශයෙන් මුතු කිමිදීමේ නිරත වූ කණ්ඩායම වූහ. 1694ට අයත් ඕලන්ද මුතු කිමිදුම් වාර්තාවක පරුවා ප්‍රධානියා වූ ජාන් ද කෘස් සහ කරියා ප්‍රධානියා වූ ඇන්තනි ද මෙල්හෝ නැමැත්තන් පිළිබඳව සඳහන් වේ (Hornell, 1922, 173). 19-20 සියවස් වන විට පරවා (Parawa) හා කදෙයියර් (Kadeiyar) යන කුල දෙකක් මුතු කර්මාන්තයෙන් නියැලි බවට සාධක පවතී (Kunz & Stevenson, 1908, 114).

පරවයන් පිලිබඳව මුල් ම විස්තර සපයන අය අතර සයිමන් කාසි චෙට්ටි වැදගත් වේ. ඔහුට අනුව ධීවර ගෝත්‍ර අතර මුල් පෙලෙහි ලා සැලකුනු පරවයන් ඉන්දීය සයුරේ මුල් ම නාවිකයන් ලෙස ද සැලකේ. දමිල නිඝුන්ඩු සූල්මානී හි නෙයිදනීලේමක්කල් හෙවත් වෙරළේ වැසියන් ලෙසින් හඳුන්වන ඔවුන් සංස්කෘත භාෂාවේ දී පරසව හෝ නිෂාද ලෙස ද දමිළ භාෂාවෙන් පරාදර්, පරාදවර්, හා පරවර් ලෙසින් ද හැඳින්වෙති. භාරතයේ ගිණිකොනදිග වෙරළ මූලික කොට වාසය කරන පරව ධීවර ප්‍රජාවේ ප්‍රභවය පිළිබඳව විවිධ වූ අදහස් පවතී. සමහර තන්ත්‍ර කෘතීන්ට අනුව මෙම ගෝත්‍රය බ්‍රාහ්මණ හා ශුද්‍ර කාන්තාවන්ගෙන් පැවතෙන්නෝය. ජාතිබේදී තූල් කෘතියට අනුව ඔවුන් කුරාව (බඳුන් තනන්නන්) පුරුෂයකු හා සෙට්ටි කාන්තාවගෙන් පැවතෙති. නමුත් පරවයන් අතර ම පවතින උත්පත්ති කථාවකට අනුව තමන් ගේ පැරැන්නන් මුහුදට අධිපති වරුණගෙන් පැවතෙන්නන් බවත් අසුරයන් විනාශ කිරීමට සිව විසින් කාර්තිකේය මැවූ මොහොතේ ඔහු සමඟ පූජනීය සරවන විලෙන් ඔහුගේ පිරිවර ලෙස මතුවූ බවත් කියැවේ. ගෙවීගිය කල්පය අවසාන වන විට මුළු පොළොව ම මහා ගංවතුරකින් වැසී ගියෙන් ඔවුන් බෝට්ටුවක් (දෝනි) තනාගෙන එම විනාශයෙන් ගැලවීගත් අතර ගොඩබිම මතුවී ඔවුනගේ යාත්‍රාව නතර වූ ස්ථානයේ දෝනිපුර නමින් නගරයක් ගොඩනගා පදිංචි වූ බවත් සඳහන් වේ (Cassi Chitty, 1837, 130). 1735 දී ෆ්‍රැන්ක්‍යුබර් හි දමිළ භාෂාවෙන් පළවූ හිස්ටෝරියා එක්ලෙසියැස්ටිකා කෘතියෙන් ඔවුන් බයිබලයේ පර්වෙයිම්වරු සමඟ දැක්වෙන බවත් එයට තවත් කරුණු එක් කරමින් ඔවුන් සොලමන්ගේ යුගයේ මුහුදු ගමන් සඳහා ප්‍රසිද්ධව සිටි බවත් දක්වති. මෙය තහවුරු කිරීමට එතරම් ප්‍රබල සාධක නොමැත. පවතින සාමාන්‍ය පිලිගැනීම වනුයේ පරවයන්ගේ මුල් රට අයෝධ්‍යාව හෝ ඖඩය බවයි. තව ද මහාභාරත යුද්ධ සමයට පෙර ඔවුන් යමුනා නදියෙන් සීමාවූ ප්‍රදේශයක වාසය කල බවට සාධක ඇත. 19 සියවස මුල් භාගය වනවිට ඔවුන්ගේ ජනාවාස තින්නවැලි දිස්ත්‍රික්කයේ වරාය නගර වල ද ලංකාවේ වයඹදිග ප්‍රදේශවල ස්ථාපිත ව

තිබිණ (Cassi Chitty, 1837, 130., Herdman, 1903,02). මැලෝනි විසින් දැක්වූ අදහස් ද පාදක කරගනිමින් පරවයන් පිළිබඳ අදහස් දක්වන සුදර්ශන සෙනෙවිරත්න දක්වනුයේ සංස්කෘතයේ භරත සහ සිංහලයේ බරත ලෙස හැඳින්වෙන පිරිස ද්‍රවිඩ පරත යනුවෙන් ව්‍යවහාර වන බවත් ඔවුන් පරතර්/ පරතවර්/ පරවර් යන නම්වලින් හැඳින්වෙන ජනවර්ගය විය හැකි බවත් ය (සෙනෙවිරත්න, 1987, 68).

තමන් සතුව තිබ නාවික බලය හේතුවෙන් සැබැවින් ම ඔවුන් වරක් බලවත් පිරිසක් ව සිටි බව නිසැක ය. නමුත් භාරතයට එල්ල වූ මුහම්මද් ආක්‍රමණ සමඟ ඔවුන් තමන්ගේ ධීවර බිම් වලින් පලවා හරිනු ලැබුණු අතර ඔවුනට තම බලය නැවත ලබා ගැනීමට හැකි වූයේ පෘතුගීසි ආධාර මත ය. පෘතුගීසීන් විශේෂයෙන් පරවයන්ට සිය ආරක්ෂාව සැලසූ බවට ඔවුනගේ වාර්තාවල පැහැදිලි කරයි (Hornel, 1922). එයින් පසුව ඔවුන්ගෙන් 20,000ක් පමණ ක්‍රිස්තියානිය වැලඳ ගත්හ. ෆ්‍රැන්සිස් ක්ෂාවියර් පූජකතුමන් 1542 දී ටියුටිකොරින් වෙත පැමිණීමත් සමඟ ඔවුන් සත්‍ය වෙත විශ්වාසය පළ කිරීමට වූ බව ද එක් අයකු නොහැර මුලු පරවර ගෝත්‍රය ම රෝමානු කතෝලික පල්ලියට අවනත වූ බව ද පෘතුගීසින් විශේෂිතව වාර්තා කරති. පෘතුගීසින් විසින් පරවරයන් වෙත කාරුණිකව සැලකූ බවත්, ද කෲස්, ද අන්ද්‍රාදෝ, ද කුන්හා, ද ලීමා වැනි පෘතුගීසි කුලවැද්දුම් නම් ගැනීමට අවසර දුන් බවත් නොරහසකි (Cassi Chitty, 1837, 130). ට්‍රැවන්කෝරයේ පරවන්වරු පිළිබඳව සඳහනක් තබන සුබ්‍රමනී අයියර්, ඔවුන් විසින් බහුලව භාවිත කරන වාසගමක් වශයෙන් කුරුප්පු යන නාමය දක්වයි (Thurston, 1909, 154). පරවා නායකයන්ට දොම් යන ගරු නාමය ද පවරා තම වංශවත් බව පෙන්වීමට කුරුසිය සහිත රන් දම්වැලක් ගෙල පැළඳීමට අවසර දෙන ලදී. නමුත් කෙටි කලකින් ඔවුන් යළිත් හින්දු ආගමට හැරුණු බව ද වාර්තා වේ. මෙහි දී වැදගත් වනුයේ පරවයන් විසින් වෙනත් ආගමක් වැලඳ ගැනීම නොව ඔවුන් මුස්ලිම් ආක්‍රමණිකයන් ට විරුද්ධව එතරම් ආධාර ඉල්ලීමට හේතුවයි. දැනට පෙනීයන කරුණු අනුව දක්ෂිණාපථය වෙත ආක්‍රමණ එල්ල කළ ඉන්දු-මුස්ලිම්වරුන්ගේ ප්‍රධාන ඉලක්කයක් වූයේ මුතු කර්මාන්තය සියතට ගැනීමයි. එය මෙයින් පසු වකවානුවේ ඉතා පැහැදිලිව ප්‍රකට වේ. ප්‍රාදේශීය හින්දු පාලකයන්ගේ සහය ද ලබා ගත් මුස්ලිම්වරුන් විසින් පරවාවරුන් නොතකා මුතු වෙළඳාමට අවතීර්ණ වූයෙන් පරවාවරු අසරණ වූහ. අනෙක් අතට පෘතුගීසින් විසින් එම ප්‍රදේශ ආක්‍රමණය කරන විට ඔවුනගේ එදිරිවාදීන් වූ මුස්ලිම්වරුන් පලවා හරින අතරම ඉතා දීර්ඝ කාලයක් පුරාවට මුතු කිමිදීමේ ප්‍රවීණයන් වූ පරවයන්ගේ සහය අපේක්ෂා කළ බව පැහැදිලි ය. පෘතුගීසින්ගේ සහය ලැබගත් පරවයන් භාරතයේ යළිත් තම වෘත්තියේ ඉහළ තත්ත්වයකට පත් වූ බවට සාධක පවතී (Cassi Chitty, 1837, 132).

ඕලන්දයන් පැමිනි වහා ම බැල්දියස් වැනි පූජකවරුන් විසින් පරවයන් රෝමානු කතෝලික ආගම අතහැර තම ආගම වැළඳ ගැනීමට පෙළඹවීමට ක්‍රියාකළහ. නමුත් එය අසාර්ථක වූවා පමණක් නොව එය කැරැල්ලක් ඇති වීමේ ප්‍රතිරෝධයක් දක්වා වර්ධනය වූයෙන් ටියුටිකොරින් හි ඔවුනට නිදහසේ ජීවත් වීමේ වරප්‍රසාදයක් දීමට ඕලන්ද රජයට සිදුවිය (එම, 132).

කාසි චෙට්ටි විසින් පරවයන් පංති 13 බෙදා දක්වනු ලැබේ. මේවා අතර එතරම් පැහැදිලි වෙනසක් නොමැත. නමුත් ඒවායේ වෘත්තීය වෙනසක් සඳහන්වන බැවින් මෙහිලා සඳහන් කිරීම වැදගත් වනු ඇත (එම, 133).


- ප්‍රථම පංතිය - මුලාදෑනීන්
- දෙවන පංතිය - රෙදි වෙළෙන්දන්
- තෙවන පංතිය - කොරල් සඳහා කිමිදෙන්නන්
- සිවුවන පංතිය - යාත්‍රිකයන්
- පස්වන පංතිය- මුතු බෙල්ලන් සඳහා කිමිදෙන්නන්
- හයවන පංතිය - හක් බෙල්ලන් සඳහා කිමිදෙන්නන්
- හත්වන පංතිය - රෙදි අසුරන්නන්
- අටවන පංතිය - කැස්බෑවන් අල්ලන ධීවරයන්
- නවවන පංතිය - මුහුදු ඌරන් අල්ලන ධීවරයන්
- දහවන පංතිය - මෝරන් හා වෙනත් මසුන් අල්ලන ධීවරයන්
- එකොළොස්වන පංතිය - පල්ලැක්කි ඔසවන්නන්

- දොලොස්වන පංතිය - තම ප්‍රධානියාගේ කටයුතු සඳහා සහාය වන කාර්ය සහයකයන්
- දහතුන්වන පංතිය - කකුළුවන් අල්ලන්නන්

මෙම වර්ගීකරණයේ ඇති වැදගත්කමක් වනුයේ එයින් විශාල පිරිසක් සමුද්‍රාශ්‍රිත වෘත්තීන්ට අයත් වීමය. සුදර්ශන් සෙනෙවිරත්න හට අනුව පරතවර් ජනයාගේ එක් කොටසක් තමන් අත පැවති සමුද්‍රාශ්‍රිත මූළ ධනය වඩාත් වර්ධනය කොට ඉහළ වාණිජ පංතියක් බවට පත් වූ අතර තවත් කොටසක් සම්ප්‍රදායික ජීවන වෘත්තීන්ගේ නිරත වූහ (සෙනෙවිරත්න, 1987, 72). ඇඳුමෙන් භාරතීය පරවයන් හා ලාංකේය පරවයන් වෙනස් වූයේ ලාංකේය පරවයන් ඇඳුම මතින් කෙටි කබායක් පැළඳීමෙන් පමණි. යටි කය සෝමනයකින් වැසිනි. ලංකාවේ පරවයන් කුලයක් වශයෙන් අඩපෙනාර් නමින් හැඳින්වුණු තමන්ගේ ම නායකයකු යටතේ ද පරිපාලනමය වශයෙන් තමන් සිටින දිස්ත්‍රික්කයේ මුදලියර් ගේ පාලනයට ද යටත් වූ අතර රාජකාරි සේවය පැවති යුගයේ ගෙවීමකින් තොරව මුහුදු රාජකාරී කටයුතු සඳහා රජයට සේවය සැපයීමට බැඳී සිටියහ ( Cassi Chitty, 1837, 134).




රොබට් පර්සිවල් විසින් මුතු කිමිදීමේ නිරත වූ කුල අතර පරවයන් සමඟ මරවා (Marawa) කුලය ද සඳහන් කරයි. මලබාර් වෙරළ වැසි ප්‍රාදේශීය උප දමිලයන් වර්ගයක් වූ මෙම පිරිස රෝමානු කතෝලික ආගම වැළඳගත් පිරිසක් වශයෙන් සඳහන් වන අතර එම ප්‍රදේශයේ සිට ලංකාවේ මුතු කර්මාන්තයේ නිරතව වීමට සංක්‍රමණය වූ බව දක්වයා. මෙරට දී ඔවුන් ඉරිදා




**මුතු කිමිදෙන්නෝ. අ අංක 354 දරමින් කිමිදුම් සෘතුවකට එක් වූ ඉන්දීය කිමිඳුම්කරුවෙක්, ආ 1906 කිමිඳුම් සෘතුවට එක්වූ අරාබි කිමිඳුම්කරුවෝ තම නාස් ආවරණ පැළඳ (මූලය අ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව අනුග්‍රහයෙනි, ආ Ondaatje,2005 )**



ලංකාවේ මරිච්චුකුඩාහි සිටි භාරතීය මුතු ශිල්පීන් පිරිසක් (මූලය Kunz and Stevenson, 1908, 114)

දින නිවාඩු දිනයක් වශයෙන් පවත්වා ගනිමින් අරිප්පුවේ දේවස්ථානයේ දේව මෙහෙයන්ට ද එක් වූහ (Percival, 1805, 88., 1990,62).

පරවාවරුන් සමඟ ම එක්ව හමුවන තවත් යෙදුමක් වන පට්ටන්ගටයින් (*Pattangatyn*) යන්න තනතුරු නාමයක් ලෙස ව්‍යාවහාර වූවකි (Thurston, 1909, 154). යාපනයේ පට්ටන්ගටයින් වූ දොන් රොද්‍රිගෝ, පරුවා, කරියා සහ පල්ලෙවෙල්ලිවරුන්ගේ ප්‍රධාන පට්ටන්ගටයින්වරයා, පට්ටන්ගටයින්වරුන්ගේ කනකපුල්ලේවරු පිළිබඳ ව සඳහන් ඕලන්ද වාර්තා අතරින් හමුවේ (Hornell, 1922, 174). මෙය ඉහත ද දැක්වූ ආකාරයට පරවාවරුන්ගේ නම් සමඟ යෙදී ඇති තනතුරක් වුව ද සමානව ම මුස්ලිම්වරුන්ට ද යෙදී ඇති බැවින් එක් විශේෂ වාර්ගික කොටසකට සුවිශේෂී වූ තනතුරක් නොවූ බව කිව හැකි ය.

### වෙළඳපොලේ වාර්ගික නියෝජනය

මුතු කිමිදීමේ සෘතුව ට වාර්ෂික ව අති විශාල වෙළඳුන් ප්‍රමාණයක් පැමිණි අතර ඔවුන් වාර්ගික වශයෙන් ප්‍රධාන වර්ග දෙකක ට අයත් විය.

1. චෙට්ටි හෙවත් සෙට්ටියන් - දකුණු ඉන්දීය දමිළ වෙළෙන්දන් වූ මොවුන් තමන්ව විවිධ නම්වලින් හඳුන්වාගත්හ. නිදසුන් වශයෙන් මධුරාවෙන් පැමිණියවුන් කාසුක්කඩයි චෙට්ටීන් ලෙස ද නෙගපටම් සිට පැමිණියවුන් කමති චෙට්ටීන් ලෙස ද ලංකාවේ ම යාපනයෙන් පැමිණි පිරිස නද්දුක්කොඩ්ඩයි (හෝ නද්දුක්කොට්ටයි - Naddukoddai) චෙට්ටීන් ලෙස ද හැඳින්විණ (S.P., 1889,XXIV,03). මධුරා, රාම්නාද්, ට්‍රිචිනාපොලි, පරම්බකුඩි, තේවකොඩ්ඩයි, පම්බන්, කුම්භකෝනම්, හා වෙනත් දකුණු ඉන්දීය නගරවලින් පැමිනි චෙට්ටින් ලංකාවේ නද්දුක්කොඩ්ඩයි චෙට්ටින්ගෙන් වෙනස්කර පෙන්වූ ප්‍රධාන සාධකයක් වූයේ ඔවුනගේ ඇඳුම ය. ලංකාවේ චෙට්ටින් ඉතා අවම ඇඳුම් ප්‍රමාණයක් සහිතව යම්තමින් විලිවසාගත් පිරිසක් වුව ද ඔවුනගේ භාරතීය සහෝදරයන් අර්ධ යුරෝපීය ඇඳුම් හා හම් පාවහන් පැළඳ බස්තමක් අතින් ගෙන සිටීමෙන් කැපී පෙනුනහ (Kunz & Stevenson, 1908, 122). මෙම වෙළඳුන් වෙළඳ කුලයක් ලෙස ද හැඳින්විණ. ඔවුන් මුදල් පොලියට දීම සම්බන්ධයෙන් ද ප්‍රසිද්ධියක් ඉසුලූහ (Indrapala,1990,155).

මෙම චෙට්ටි පිරිසක් පිළිබඳව ෆර්ගසන්වරුන් මෙසේ සඳහන් කරයි.

*''බොම්බායේ සිට පැමිණි ජේත්තුකාර සේට්වරුන් (චෙට්ටිවරුන් වෙසෙසකි)*



රූපය 1. පර්සියානු ජාතික මුස්ලිම් මුතු වෙළඳුන්ගේ දරුවන් පිරිසක් ලංකාවේදී (මූලය Kunz and Stevenson 1908, 120, 1)

*පෞද්ගලිකව වෙළඳකටයුතුවල දී තමන් ම පෙනී නොසිටියහ. ඔවුන් නිසැකව ම නියෝජිතයන් මගින් ක්‍රියාත්මක වූහ. සේට්වරුන් නිතර ම සඳහන් කළේ තමන්ගේ කුලීනත්වයත් සුළඟත් අතරට නූගත් මහජනයා පැමිණෙනවාට තමන් අකමැති බවයි (Furguson & Furgosun, 1888, 385)".*

**2. මුස්ලිම් වෙළඳුන්** - ලංකාවේ කොළඹ, යාපනය, මන්නාරම, එරුක්කලම්පිට්ටි වැනි ප්‍රදේශවලින් ද භාරතයේ බොම්බාය, කීලාකරයි, තොන්ඩි, අන්ද්‍රාපටම්, නාගෝර්, රාම්නාද් වැනි ප්‍රදේශවලින් ද පර්සියානු බොක්ක කලාපයෙන් ද මොවුන් පැමිණියහ (S.P., 1889,XXIV, 03, Ali, 2006,01). ලෙනාර්ඩ් වුල්ෆ් විසින් මෙම මුස්ලිම් වෙළෙන්ඳන් පිළිබඳව සඳහන් කරමින් දැක්වූයේ ඔවුන් තරම් මුතු සහ මැණික් වල අගය හඳුනාගන්නා වෙනත් පිරිසක් නොමැති තරම් ය, යනුවෙනි. මුතු ඇගයීම ඔවුන් විසින් දියුණුකළ විශේෂ හැකියාවක් බව පෙනී යයි. නිදසුනක් වශයෙන් 1881 සිට 1905 දක්වා පත්කරනු ලැබූ පංච පුද්ගල මුතු ඇගයුම්කරුවන්ගේ කමිටුවෙහි මුතුපර පරීක්ෂකයාත්, අදිගාරුත් හැර අනෙක් තිදෙනා ම මුස්ලිම්වරුන් විය (Ali,2006,1). පාර්සිවරුන් ද මුතු මිල දී ගැනීමට නැව් වශයෙන් සංවිධානය වී පැමිණියහ (Furguson & Furgosun, 1888, 385).

මෙවකට මුතු බෙල්ලන් මිල දී ගැනීම සඳහා පෙරුනාලි, කමුති හා කරාකල් වැනි ප්‍රදේශවල සිට පැමිණි කුලයක් වශයෙන් නාදන් හෝ චානාර් (Nadan / Chanar) කුලය ද සඳහන් වේ. මොවුන්ගේ මිල දී ගැනිම් ඉතා අවම මට්ටමක විය (Kunz & Stevenson, 1908, 122).

මෙම වෙළඳුන්ගෙන් සමහරක් දෙනා තම මුදල් යොදවා මුතු මිල දී ගැනීමෙන් සහ විකිණීමෙන් ලාභ ලැබූහ. නමුත් විශාලත ම ලාභය ලැබූයේ විනිමය හුවමාරුවේ නියැලුණු පිරිස ය. කිමිදුම් සෘතුවල දී ලංකා තඹ කාසි භාණ්ඩාගාර බිල්පත්වලට, පගෝදිවලට, ස්පාඤ්ඤ ඩොලර්වලට හෝ වෙනත් ඕනෑම විදේශීය රන් රිදීමය මුදල් වර්ගයකට ඔවුන් මාරු කර දුන් අතර අගයෙන් සියයට තුනක් හතරක් තම ගාස්තුව වශයෙන් අය කළහ. මෙම මුදල් කඳවුරේ දෛනික ගණුදෙනුවල දී ව්‍යාවහාර විය. කිමිදුම් සෘතුව අවසාන වීමෙන් පසුව සියල්ලන්ට ම අවශ්‍ය වනුයේ තමන් සතුව එකතු වී ඇති කුඩා තඹ කාසිවල බරෙන් නිදහස් වී ඒවා නෝට්ටු හෝ වෙනත් මාධ්‍යයකට හුවමාරු කර ගැනීමට ය. මෙහි දී නැවතත් විනිමය හුවමාරු කරන වෙළෙන්දන්ට ලාභයක් ලබාදෙමින් මුදල් හුවමාරුව සිදුවේ (Bertolacci, 1993, 191).

මුතු කිමිදීම් කඳවුරක ජනගහණය සමන්විත වූයේ කිමිඳුම්කරුවන්, වෙළෙන්ඳන්, රජයේ නිලධාරීන්ගෙන් සහ වෙනත් කම්කරුවන්ගෙන් පමණක් නොවේ. කඳවුරේ පැවැත්මට සුවිශේෂී දායකත්වයක් ඇස්බැන්ඳුම්කරුවන්, නටන්නන්, පිනුම්කාරයන්, සුදු කෙලින්නන්, හිගන්නන්, ආබාධිතයන්, කුරුම්ට්ටන්, බංකොලොත් වූවන්, විවිධ සහය වෘත්තීන්හි මෙන් ම වෛශ්‍ය වෘත්තියේ ද නියැළුනු කාන්තාවන්ගෙන් ද යුක්ත විය. එමෙන් ම ෆකීර් හෙවත් මහම්මදික පූජකයන්, බ්‍රාහ්මණයන්, පණ්ඩාරම් හෙවත් හින්දු ශුද්‍ර හෝ වෙනත් පහත් කුල පූජකයන්, ආදීන් ඇතුලත්ව සෑම ආගමකට ම අයත් පූජකයන්

ආධාර සොයමින් කඳවුරු බිම්වල සැරුහ. බෙල්ලන් එකතුකරගෙන වෙරළට පැමිණෙන යාත්‍රිකයන් ඒවා කොට්ටුවට දමා අනුගමනය කළ යුතු රාජකාරී ක්‍රියා පිළිවෙතට අනුව යමින් කටයුතු අවසාන කර අනතුරුව ගමන්කලේ කඩමණ්ඩියට ය. යටත්විජිත යුගයේ මුතු කිමිදීම් කටයුතු ඉරිදා හැර සතියේ සෑම දිනයක ම සිදු විය. බොහෝ යාත්‍රා නියමුවන් සහ කිමිදුම්කරුවන් කතෝලික සහ ක්‍රිස්තියානින් වූයෙන් එම දිනයේ ඔවුන් දේවස්ථානයන්හි දේව මෙහෙයන්ට එක් වූහ. හින්දූන් සහ ඉස්ලාමිකයන් එම දිනය තම විවේක දිනයක් වශයෙන් ගත කළ හ (S.P 1889,XXIV,01., Cordiner, 1807, 74).

**මෝර බන්ධකයෝ**

මුතු කිමිදුම් කඳවුරක සිටි පිරිස් අතර වාර්ගික වශයෙන් නියෝජනයක් එතරම් කැපී නොපෙනුන ද මෝර බන්ධකයන් යන නමින් හැඳින්වුණු මලයාලි සහ කේරළ වැනි මන්ත්‍රකරුවන් ද වැදගත් වේ. මුතු කිමිදීමේ නිරත වූ කිමිදුම්කරුවන්ට දැඩි ජීවිත තර්ජනයක් ගෙන ඒමට මෝරා සමත් විය. මිනිසුන්ට පහර දීම් බෙහෙවින් කලාතුරකින් වාර්තාවුව ද එක් වරක් හෝ එවැන්නකට හුරු වූ මෝරුන් නොකඩාවා කිමිදුම්කරුවන්ට පහර දීමට ඉදිරිපත් විය. කිමිදුම්කරුවන් මෙම අවදානමට අතීතයේ සිට ලක්වූ බව ප්ලිනි සහ ප්‍රකෝපියස් විසින් සඳහන්කරන මෝරුන් සම්බන්ධ කල්පිත පුවත් කිහිපයකින් හෙළි වේ. ප්ලිනි දක්වනුයේ මුතු බෙල්ලන්ව මුහුදු බල්ලන් (canis marini) විසින් ආරක්ෂා කරන බවයි. මෙවකට මුහුදු බල්ලා යන නමින් විවිධ මෝර විශේෂයන් හැඳින්විණ (Bostock & Riley, 1855, 433, 456). මුතුපර ආශ්‍රිතව සිටි මෝරුන් විසින් කිමිදුම්කරුවන්ට තිබූ බලපෑම ක්‍රි.ව.1 සියවස වන විට රෝමයේ ද ප්‍රසිද්ධව තිබූ බව මෙයින් පැහැදිලිය.

සැබැවින් ම වෘත්තීය මුතු කිමිදුම්කරුවන්ට තිබූ ප්‍රධානත ම ජීවිත තර්ජනය වූයේ මුතු පර ආශ්‍රිතව සිටි මෙම මෝරුන් ය. මෝරුන්ගෙන් සිදුවූ තර්ජනයන් වළක්වා කිමිදුම්කරුවන්ට ජීවිත ආරක්ෂාව සලසාදීමට ඉදිරිපත් වූ මෝර මන්ත්‍රකරුවන් සහ මෝර බන්ධනයන් මෙවකට විසූහ. මාර්කෝ පෝලෝට අනුව මෝරුන් නැවැත්වීමේ මන්ත්‍ර හැකියාව වූ බ්‍රාහ්මණයන්ව වෙළෙන්ඳන් විසින් සේවයේ යොදවාගන්නා ලදී (TMP,284). ඔවුන් කඩල් කට්ටි, චඩල්කුට්ටි (*Kaddal katti/cadalcutti)* වැනි දමිල නම් වලින් ද මලබාරයේ දී පිල්ලල් කර්රස් (*Pillal Karras)* නමින් ද හින්දියෙන් හයිබන්ඩා (*hybanda)* නමින් ද හැඳින්විණ. පිල්ලල් කරස් යනු මෝරුන් බඳින්නා යන්නයි. මෝරුන් මුතු කිමිදුම් ප්‍රදේශයෙන් ඉවත්කර තැබීමේ හැකියාව ඇතැයි පැවසුන කේරළ මලයාලි ගුරුන් වූ මොවුන්ගේ ඒකාධිකාරයක් පැවතුණු අතර එහි නියැලෙන්නකුගේ සම්බන්ධතාවයකින් තොරව මෝර බන්ධකයකු වීමට කිසිවකුට නොහැකි වූ බවක් පෙනී යයි (Cordiner, 1807, 52). ඔවුන්ට රජයෙන් ගෙවීම් සිදු කළ අතර වටිනා ත්‍යාගයන් වෙළඳුන්ගෙන් ද හිමිවිය. මෝරුන්ගේ ප්‍රහාරයන්ගෙන් ආරක්ෂාව ලබා දිය හැකි යන්ත්‍ර කිමිදුම්කරුවන් වෙත පැළඳීම සඳහා ලබා දීම ද මොවුන්ගෙන් සිදුවිය (Percival,1990,66). එමෙන් ම එක් එක් කිමිදුම්කරුවාගේ ආගම අනුව වෙනස් වූ ගුරුකම් කටයුතු ඔවුන් සිදුකලහ. තමන් පවා තේරුම් නොදත් මන්ත්‍ර ගායනා කරමින් සහ යකැදුරු නර්තනයේ යෙදෙමින් මෙම මන්ත්‍රකරුවන් ජප කළ බවත් එහි දී මන්ත්‍රවල බලය පවත්වා ගැනීමට යයි පවසමින් ඔවුන් කිසිදු ආහාරයක් හෝ පානයක් ගැනීමෙන් වැලකුනු බවත් රොබට් පර්සිවල් සඳහන් කරයි. නමුත් සමහර අවස්ථාවල රා පානය කරන යකැදුරන් බිම ඇද වැටෙන තරමට ම මත් වී නර්තනයේ යෙදුණහ (Percival, 1805, 90, 93). ඉතා ඈත අතීතයේ එක් යාත්‍රාවක ට එක් අයකු බැගින් මෝර බන්ධකයන් සේවයේ නියුතුව සිටිය ද පෘතුගීසි සමයේ එය දොළොස්දෙනෙකු පමණ දක්වා ද බ්‍රිතාන්‍ය යුගයේ දී දෙදෙනෙකු පමණ දක්වා ද පහත වැටින. කෝඩිනර් විසින් මොවුන් මෝරුන් සම්බන්ධව කරන අභිචාරය පහත ආකාරයට විස්තර කරයි (Cordiner, 1807, 52).

*''..සාමාන්‍යයෙන් කිමිදුම්වාරයකට බන්ධකයන් දෙදෙනකු එක් වෙති. මොවුනගෙන් එක් අයකු නායක නාවිකයා ගමන්කරන බෝට්ටුවෙන් කිමිදුම් සඳහා යන යාත්‍රා සමග පිටත් වන අතර අනෙක් තැනැත්තා වෙරළේ තනාගත් මඩුවක කිසිවකු ට තමන් ව නොපෙනෙන ලෙස වසාගෙන නිරුවත්ව සිටී. එහි සිටින ඔහු*

*තමන් ඉදිරියේ ජලය පිරවූ තඹ බඳුනක රිදියෙන් කල ගැහැණු සහ පිරිමි මෝර රූපය බැගින් දමා බලා සිටී. යම් හෙයකින් එක් රූපයක් අනෙකක් හපන ආකාරයට හැපුණු විට මුහුදේ කරදරයක් වීමට නියමිත බව ඔහු දැන ගනී. යාත්‍රා පිටත් වීමේ සිට නැවත පැමිණෙන තුරු ඔහු තම කාලය ගත කරන්නේ මෙම මඩුව තුළ ය........*

1800 වසරේ Asiatic Annual Register හි පළ කිරීම සඳහා ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා විසින් එංගලන්තයට යැවූ මුතු කිමිදීම පිළිබඳ ලිපියේ ද විශේෂිත ස්ථානයක් මෝර බන්ධකයන්ට හිමි ව ඇත. බ්‍රිතාන්‍ය රජය ප්‍රතිපත්තියක් වශයෙන් ස්වදේශිකයන්ගේ අභිචාර කටයුතු සඳහා මැදිහත් නොවීමේ තීරණයක් ගෙන තිබූ බැවින් හා පරවල හොරෙන් කිමිදීම තහනම් කළ පසුව මෙවැනි ගුප්ත කටයුතුවල පවා සේවයේ වැදගත්කමක් වූයෙන් මන්ත්‍රකරුවන් සේවයේ යොදවා ගැනින. නමුත් ඔවුන් තමන්ගේ බලය අත්තනෝමතික ලෙස කිමිදුම්කරුවන් වෙත යෙදවීම වැළැක්වීමට රජය විසින් දිනකට තමන්ගේ වේතනය ලෙස එක් කිමිදුම්කරුවකුගෙන් එක් බෙල්ලකු පමණක් ලබාගැනීමට හැකි වන ලෙස නියෝග පැනවිය. පසුව ඔවුන්ට රජයෙන් දීමනාවක් ගෙවීමට කටයුතු යොදන ලද නිසාවෙන් කිසිදු හේතුවක් මත යාත්‍රිකයන්ගෙන්, කිමිදුම්කරුවන්ගෙන් හෝ වෙනත් කිසිවකුගෙන් හෝ බෙල්ලන් ලබා ගැනීම මන්ත්‍රකරුවන්ට තහනම් කරන ලදී (Kunz & Stevenson, 1908, 116). ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වී යාත්‍රාවල ගමන්කරමින් ආරක්ෂාව සලසන නියායෙන් සොරකමේ යෙදීමේ හැකියාව ද මෙයින් ඉවත්කරන ලදී. හැකි සෑම අවස්ථාවක ම පුරසාරම් සහ පුරාජේරු මගින් ස්වකීය ප්‍රතිරූපය ගොඩනංවා ගැනීමේ දක්ෂ පිරිසක් ලෙස මෝරබන්ධකයන් පිළිබඳ ව බොහෝ විට විස්තර වේ. යම් අනතුරක් වූ විට එය තම විරුද්ධවාදියෙකු විසින් කරන ලද අනවිනයක් බව දක්වන ඔවුන් එය කැපීමේ හැකියාව ද තමන් සතු බව පවසා ඉදිරි සෘතුවට ආරක්ෂාව සලසන බවට ද සහතික වෙති. ඉදින් යම් ලෙසකින් කිසිදු අනතුරක් නොවූ යේ වී නම් මෝර බන්ධකයාගේ කීර්ති යසෝඝෝෂය සියල්ලන් විසින් පැවසීමට වන්නෝ ය. මෝරන්ගේ අනතුරු අවම වීමට තවත් හේතුවක් වූයේ තමන් අවට මෝරකු ගැවසෙන බව එක් කිමිදුම්කරුවකුට දැනුණු විට වහාම ඒ පිළිබඳව අනෙක් පිරිසට ද දැනුම් දීම ය. වහා යාත්‍රාවලට නැග ගන්නා කිමිදුම්කරුවෝ අනතුර පහවූ බව දැනුනු විට යළි කටයුතු අරඹන අතර නො එසේ නම් වෙරළ බලා හැරී යාම බොහෝවිට සිදුවිය (Percival, 1805, 94).

වාර්තාගත ඉතිහාසයේ වසර හයසියයකට ආසන්න කාලයක් පැවති මෝර බන්ධකයන්ගේ සේවය 1885 දක්වා අඛණ්ඩව ලබා ගන්නා ලදී. එම වසරේ කිමිදුම් වාරයක් පැවැත්වෙන අතරතුර අදාල කඳවුරේ මෝර බන්ධකයා එවකට මුතු පර පාලකයාව සිටි කපිතන් ටවයිනම් වෙත නොදන්වා රට තුළ වූ වී වෙන්දේසියකට යෑම නිසා රාජකාරිය නිසි ලෙස ඉටු නොකිරීමේ චෝදනාව මත ඔහු සේවයෙන් පහ කරනු ලැබිණ (Furguson & Furgosun, 1888, 396). එයින් අනතුරුව යලිත් පුරප්පාඩු පිරවීමක් සිදුනොවූ අතර රාජ්‍ය අනුග්‍රහය නොලැබීම හේතුවෙන් මෝර බන්ධකයෝ මුතු කර්මාන්තයෙන් ක්‍රමයෙන් ඈත් වූහ. ඔවුන්ගෙන් ඉටු වූ සේවය කෙබඳු වුවත් 1885 වසරේ හෝ එයින් පසුව වුව එතරම් මෝර ප්‍රහාර පිළිබඳව අසන්නට නොලැබේ.

මෝර බන්ධකයන් දක්ෂිණ භාරතයේ ආර්ය බලපෑම ආරම්භ වීමත් සමඟ බ්‍රාහ්මණ කුලයට සම්බන්ධ වූ බව මෙම මෝර බන්ධකයන් බ්‍රාහ්මණ කුලිකයන් වීමෙන් පැහැදිලි වේ. යම් යම් ස්වභාවික වස්තූන්ට සම්බන්ධ යක්ෂ ආත්ම ජීවමාන වෙසින් සතුන් වශයෙන් පෙනී සිටින අවස්ථා දේශීය වූ භාරතීය සංස්කෘතියේ ප්‍රකට වූ අතර ධනෝපායන කර්මාන්තයක් වූ මුතු කිමිදීමෙන් ලැබෙන ආදායමෙන් කොටසක් අත්පත් කරගැනීමට බ්‍රාහ්මණයන්ට ලැබුණු අනගි අවස්ථාවක් වූයේ මෝරුන් මුතුපර ආරක්ෂාකරන බවට පැවති විශ්වාසය තමන්ගේ දර්ශණය තුළට උකහාගෙන එය දුරලීමට තම සේවය සැපයීමයි. පසුකාලීනව මොවුන් මුහුදුබඩ වෙනත් ජනවර්ග සමඟ මිශ්‍රවන්නට ද ඇත.

## සමාලෝචනය

සරල වාර්ගික පදනමකින් ශ්‍රී ලංකාවේ ජන සංයුතිය හදාරන විට එය සිංහල, දෙමළ, මුස්ලිම් සහ අවශේෂ ලෙස සාකච්ඡාවට ලක්

කෙරේ. මෙයින් විශේෂයෙන් ග්‍රාමීය සිංහල සහ දමිල ජනතාව මානව වංශ අධ්‍යයන සඳහා බොහෝ විට පාත්‍ර වේ. නමුත් ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා බැඳුණු වාර්ගික පදනම් සහ එම වාර්ගිකයන් අතර පවතින උප විශදතා එතරම් අවධාරණය කිරීමට ලක් වී නොමැති බව පෙනී යය. නිදසුනක් වශයෙන් මෙහිදී සාකච්ඡා කළ ඉස්ලාමිකයන් පිළිබඳව ශ්‍රී ලංකාවේ දී සරලව අරාබි, මැලේ, ජා, බෝරා සහ දේශිය මුස්ලිම් ලෙස වර්ගීකරණය කල ද ඓතිහාසික පදනමකින් යුතුව ගත් විට ඔවුන් අතර ප්‍රභවය අනුව වාර්ගික පදනම් පවතින බව පෙනී යයි. එය බැඳී පවතිනුයේ ඔවුනගේ මුල් බිම් හෝ වෘත්තිය අනුවය. මෙය සිංහල හෝ දමිල වැනි ජන වර්ග සඳහා ද අනන්‍ය සාධාරණය ලක්ෂණයකි. වෘත්තිය පදනමක් වශයෙන් ගෙන එම මූලය පිළිබඳ ඓතිහාසික ප්‍රවේශයකින් යුතුව සොයා බැලීම වැදගත් වනුයේ අදාල වෘත්තීය ප්‍රාගුණ්‍යත් කාලයත් සමග ගිලිහී යෑමත් ඔවුන් තමන්ට ආශ්‍රිත මහා සංස්කෘතිය සමග සම්මිශ්‍රණය වීමත් හේතුවෙනි. වාර්තාගත ඉතිහාසයේ සහශ්‍රක දෙකහමාරකට ආසන්න කාලයක් පැවති මුතු කර්මාන්තය සඳහා විවිධ ජන වර්ග මෙන් ම ඒ ඔස්සේ නිර්මාණය වූ කුල විශේෂඥභාවයන් ද ශ්‍රී ලංකාවේ මුතු කර්මාන්තයේ බිඳ වැටීමෙන් අනතුරුව මහා සමාජයට අවශෝෂණය වූ බව නිසැක ය. මෙම පර්යේෂණයේ දෙවන පියවර වශයෙන් මෙහිදී සඳහන් කල සහ නොකල, මුතු කර්මාන්තය හා ආශ්‍රිතව කටයුතු කල වාර්ගිකයන්ගේ වර්තමාන තත්ත්වය අධ්‍යයනයට ලක් කිරීම අපේක්ෂිතය.

**කෙටි යෙදුම්**

SP - Sessional Papers

TMP - The Travel of Marco Polo

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය - සිංහල කෘති**


*රාජාවලිය,* 1923, වතුවත්තේ පේමානන්ද හිමි සංස්කරණය, සිංහල පාඨ ග්‍රන්ථ කමිටුව, කොළඹ

*රාජාවලිය,* 1959, වතුවත්තේ පේමානන්ද හිමි සංස්කරණය, රත්නාකර පොත් සමාගම, කොළඹ

*වන්නි රාජාවලිය,* 2005, ගණනාථ ඔබෙසේකර සංස්කරණය, එස්. ගොඩගේ ප්‍රකාශකයෝ, මරදාන

සිරිවර්ධන, තිලංක, 2013, *ලක්දිව මුතු කර්මාන්තය,* කර්තෘ ප්‍රකාශන, නුගේගොඩ

සෙනෙවිරත්න, සුදර්ශන්, 1987, ලංකාවේ මුල් ඓතිහාසික යුගයේ ජන සම්මිශ්‍රනය පිළිබඳව අධ්‍යයනයක් ඃ බරතවරු, පිටු. 67 - 84, *යාත්‍රා* 1 කලාපය, ලංකා සමාජ ගවේෂණ සංගමය, පේරාදෙණිය.


**Refferences - English**


Administration Report of the Marine Biologist,

1915 ***Report on the government Marine Biologist for 1915***, Joseph Pearson

1931 ***Administration report of the Marine Biologist for the year 1930***, Joseph Pearson

1940 ***Administration report of the acting Marine Biologist for the year 1939***, P.E.P. Deraniyagala

Ali, Ameer, 2006, ***Pearl industry during the British period of Sri Lanka***, University of Murdoch, Western Australia.